**යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ඉරණමඩු සංරචකය) -2017**

-----------------------------------------------------------------------------------------------------------

යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ (ඉරණමඩු සංරචකය) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2711 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 2 වැවස්ථාවේ IIB වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ජලය රඳවා ගැනීමේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ඉරණමඩු කුලම් ජලාශය ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,198.30 කට සමාන එජඩො මිලියන 16.91 ක් වේ. ඉන් රු.මිලියන 1,753.70 කට සමාන එජඩො මිලියන 13.49 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 මැයි 06 දින ආරම්භ කරන ලද අතර 2017 අගෝස්තු 14 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2020 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකාවේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 13.49 | 1,753.70 | 741.00 | 4.16 | 630.38 | 8.61 | 1,265.26 |
| ශ්‍රී ලං ර | 3.42 | 444.60 | 168.00 | 1.29 | 168.00 | 2.58 | 335.13 |
| | 16.91 | 2,198.30 | 909.00 | 5.45 | 798.38 | 11.19 | 1,600.39 |

ජල සම්පත් බෙදාගැනීම මත ඉරණමඩු ප්‍රදේශයේ ගොවීන්ගෙන් වූ දැඩි විරෝධය හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු 2014 වර්ෂයේ අත්හිටුවා තිබුණු අතර නැවත 2015 වර්ෂයේ කටයුතු ආරම්භ වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,198.30 කට සමාන එජඩො මිලියන 16.91 ක්වූ මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 1,600.39 කට සමාන එජඩො මිලියන 11.19 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ධාරිතාව වැඩි කිරීම සඳහා ඉරණමඩු කුලම් ජලාශය ශක්තිමත් කිරීම සඳහා වේල්ල, වාන් මඟ හා වාන් දොරටු (Radial gates) ප්‍රතිසංස්කරණය කිරීම, රළ පනාවේ (Riprap protection) ආරක්ෂක කටයුතු ඉදිකිරීම්, පාලම් හා සොරොව් දොරටු (drop structures) සහ පිටාර මඟ ඇළ පද්ධති ප්‍රතිසංස්කරණය

(Spill tail canals) කිරීම හා වාරිමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම (lift irrigation system) ආදිය සඳහා කොන්ත්‍රාත් පැකේජ් 05 ක් යටතේ 2016 අප්‍රේල් කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ අතර 2017 අගෝස්තු 14 දිනට පෙර වැඩ අවසන් කිරමට අපේක්ෂා කර තිබුණි. මීට අමතරව, ව්‍යාපෘතිය යටතේ මාන්කුලම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවසන් කිරීමට තිබුණි. ලද තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට පැකේජ් 02 හා 04 යටතේ පැවති කාර්යයන් වන ඉරනමඩු කුලම් ජලාශයේ වාන් මාර්ගය ප්‍රතිසංස්කරණය හා වාන් දොරටු සවිකිරීම සහ පාලම් සහ ගංවතුර වේල්ල (flood bund), සහ සොරොව් දොරටු (drop structure) ඉදිකිරීම අවසන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනෙකුත් කාර්යයන් එනම්, පැකේජ් 01 යටතේ වේල්ල ප්‍රතිසංස්කරණය කිරීම, පැකේජ 03 යටතේ රළ පනාව ආරක්ෂණ කාර්යයන් ඉදිකිරීම හා පැකේජ 05 යටතේ ඉහළ ප්‍රදේශයේ හා වාරිමාර්ග ඇල පද්ධතියේ ඉදිකිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය මූලික ඉලක්ක මත සියයට 65 සිට සියයට 85 දක්වා වූ පරාසයක පැවතුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූලික සැලැස්මට ඇතුලත් වී නොතිබූ ඇළ මාර්ග හැරවුම් හා වාන් මාර්ග ප්‍රතිසංස්කරණය (Sluice approach canal) යටතේ වූ ඇළ මාර්ග ප්‍රවේශ ගේට්ටු ප්‍රතිසංස්කරණය ඇතුළු කාර්යයන් 07 රු.මිලියන 30.17 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුල ඉදිකිරීම් වැඩ නිම කර තිබූ අතර, සොරොව් දොරටු (drop structure) ප්‍රතිසංස්කරණය යටතේ වූ බොරළු පිරවූ බිම සකස්කිරීම සහ රළ පනාව ආරක්ෂණ කාර්යය යටතේ වූ ඉහළ කොන්ක්‍රීට් තාප්ප ඉදිකිරීම යනාදී අනෙකුත් කාර්යයන් පිරිවැය රු.මිලියන 29.61 කට ලබාදී තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් අදාල පාර්ශව වලින් ලබාගත් අනුමැතීන් විගණනය සඳහා ඉදිරිපත් නොවුනි.

(ආ) 2018 ජූලි මස කරන ලද භෞතික පරීක්ෂාවේදී ජලාශයේ ඉහළ පහල වේලි ඉරණමඩු ප්‍රදේශයේ ඉදිකරන ලද පාලම් සහ ගංවතුර ඉවුර සහ සොරොව් දොරටු (drop structure) යනාදිය අධික වර්ෂාව හා වාහන ගමන් කිරීම නිසා ඛාදනයට හා සෝදා පාළුවට ලක් වී ඇති බව අනාවරණය විය. තවද, රු.මිලියන 13.26 පිරිවැයක් දරා තිබුණද, පිඩැලි ඇල්ලීම (turfing) සහ අනෙකුත් පාංශු සංරක්ෂණ කාර්යයන් සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත් පැකේජ් 05 යටතේ වූ වාර්මාර්ග ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රමයේ වළවල් සඳහා පොළව කැනීම, මට්ටම් කිරීම, ජලය සහ පොහොර භාවිතය compaction purposes යන කාර්යයන්වල කියුබ් 10,642 ක් වූ මිනුම්වල දෝෂ නිසා රු.මිලියන 8.51 ක් වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.මෙම වැඩිපුර ගෙවූ මුදල 2018 පෙබරවාරි මස ආපසු ගෙවා තිබූ අතර එයින් කොන්ත්‍රාත්කරුට අතිරේක මූල්‍ය පහසුකමක් ලබා ගැනීමේ වාසියක් අත් වී තිබුණි.